# විසිවැනි සියවස මුල් භාගයේ තත්කාලීන සමාජ ඉතිහාසය පිළිබඳ අධ්‍යයනය කිරීමට යොදාගත හැකි මරණ දැන්වීම් එකතුවක්

උදය නෙලුම් රත්නායක[1]

මානවයා සිය සන්නිවේදන කුශලතාව වර්ධනකර ගැනීම මානව පරිණාමයට ප්‍රබල වශයෙන් ඉවහල්වී ඇත. මුල් අවධියේ එකිනෙකා අතර අදහස් හුවමාරුකර ගැනීමට පමණක් සීමා වූ සන්නිවේදනය කල්යත් ම සංකීර්ණ ක්‍රියාවලියක් බවට පරිවර්තනය විය. මෙම විකාශනයේ එක් වැදගත් අවස්ථාවක් වුයේ 15වැනි සියවසේ අකුරු අමුණන මුද්‍රණ ශිල්පය හඳුන්වාදීම යි. පොත්පත්, පුවත්පත් ඇතුළු ලේඛන මාධ්‍යයන් මේ හරහා දියුණුවට පත්විය. මුද්‍රණ තාක්ෂණයේ දියුණුවත් සමඟ දැන්වීම් කලාව හා ප්‍රචාරණය නව යුගයකට යොමුවී ඇත. පුවත්පත් මාධ්‍යය දියුණුවට පත්වීම සඳහා තත්කාලීන ආණ්ඩුව පිළිබඳ තොරතුරු, විවිධ ශිල්ප ශාස්ත්‍ර හා වෙළඳපොළ සම්බන්ධ නව තොරතුරු ඉදිරිපත්වීම වැඩි වශයෙන් ඉවහල් වන්නට විය. මෙම පුවත් නිකුත් කිරීම් අතරින් දැන්වීම් කලාව වැදගත් අංශයක් වන අතර එහි උප කුලකයක් වන මරණ දැන්වීම් ඉදිරිපත් කිරීම තවත් එක් කේෂ්ත්‍රයකි.

මරණයට පත්වීම යන්න හුදු මිනිස් ජීවිතයේ තවත් එක් වැදගත් අවස්ථාවකි. මරණයක් සිදුවු විට ඒ පිළිබඳ දැනුම්දීම කාලානුරූපීව, ප්‍රදේශානුකූලව හා සමාජානුකූලව වෙනස් වන්නට විය. මරණයට පත්වීම හා එහි අවසාන චාරිත්‍ර වාරිත්‍ර පැවැත්වීම පිළිබඳවත් අනන්‍යයන් සමඟ එම අවස්ථාව බෙදා හදා ගැනීමේ අපේක්ෂාවෙන් විවිධ ක්‍රමෝපායන් ඔස්සේ මරණයක් සිදුවු බව දැනුම්දීමට යොදා ගෙන ඇත. ඒ අතරින් වර්තමානයේ මරණ දැන්වීම් කලාව ඉදිරියෙන් සිටී.

මෙම අධ්‍යයනයේදී 20 වැනි සියවස මුල් දශකය කිහිපය තුළ විවිධවු පුවත්පත් හා වෙනත් මරණ දැන්වීම් ඉදිරිපත් කිරීමේ පෞද්ගලික ලේඛන ආදි රාජ්‍ය ලේඛනාග ාරයේ ඇති ලිපි එකතුවක් කෙරෙහි අවධානය යොමු වේ. එම ලේඛන අතර සමකාලීනව විසූ භික්ෂූන් වහන්සේලා, රාජ්‍ය නිලධාරීන්, ප්‍රභූ සාමාජිකයින් හා වෙනත් පුද්ලයින්ගේ මරණ දැන්වීම ආදිය අන්තර්ගත වේ. එම දැන්වීම්වල විවිධ ස්වරූප කිහිපයක් ම දක්නට ලැබෙන බැවින් ද එකල සමාජයේ විවිධ ස්ථරවල පුද්ගලයින්ගේ තොරතුරු මේ හරහා ඉදිරිපත් වන බැවින් ද තත් කාලීන සමාජ ඉතිහාසය පිළිබඳ යම් අදහසක් ඉදිරිපත් කිරීමට මේවා අධ්‍යයනය උපකාරී වේ. මෙම මරණ දැන්වීම එකතුව සමඟ නූතන මරණ දැන්වීම් අතර ඇති සමවිසමතා ද පිරික්සිය හැකිය. මේවන තෙක් මරණ දැන්වීම් අධ්‍යයනය කිරීම පිළිබඳ වැඩි අවධානයක් එතරම් යොමුකර නොමැති බැවින් මෙම පර්යේෂණ පත්‍රය හරහා ඒ සඳහා ඌණපූර්ණ සැපයීම ද තවත් එක් කාර්යයකි.

ප්‍රමුඛ පදඃ මරණ දැන්වීම්, විසිවන සියවස, සමාජ ඉතිහාසය, පුවත්පත්

1 සහය කථිකාචාර්ය, ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
Email: nelukit@yahoo.com